**KEY FACT DOCUMENT**

# අමානා යොවුන් කාලීන ආයෝජන ගිණුම

| | |
|---|---|
| සුදුසුකම් | අවම වශයෙන් රු. 50,000/- ක මූලික තැන්පතුවක්<br>සෑම Amana Teen ගිණුම් හිමියෙකුම වයස අවුරුදු 17 යන උපරිම වයස් සීමාවට යටත් වේ.<br>වලංගු ස්ථාවර නියෝගයක් සහිත Aamana Teen ගිණුමක් තිබිය යුතුය. |
| සේවාවෙහි ස්වභාවය | Amana Teen කාලීන ආයෝජන යනු නව යොවුන් වියේ පසුවන දරුවන් වෙනුවෙන්ම සැලසුම් කළ ආයෝජන ක්‍රමයකි. මෙය එකවර සිදු කරන නැණවත් ආයෝජනයක් මඟින් දරුවන්ගේ අනාගතය සුරක්ෂිත කිරීම සඳහා දෙමාපියන්ට හා භාරකරුවන්ට ලැබෙන කදිම අවස්ථාවකි. ඔබට විශ්වාසයෙන් යුතුව සිදු කළ හැකි මෙම ආයෝජනය මගින් නිසැකවම ඔබේ දරුවන්ට ඉහළ ප්‍රතිලාභ හිමි වේ. එමෙන්ම මෙය අපගේ Flexi Term ආයෝජන විසඳුමට සමාන ලෙසම, අවශ්‍ය ඕනෑම වෙලාවක අමතර මුදල් බැර කළ හැකි විසඳුමකි. |
| මූලික ලක්ෂණ | ඕනෑම වේලාවක බැංකු ශාඛාවක් වෙත පැමිණීමෙන්, මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර මඟින්, ගිණුමකින් ගිණුමකට මුදල් මාරු කිරීම මඟින් හෝ විදේශ රටක සිට මුදල් බැර කිරීම (ප්‍රේෂණ) මඟින් ගිණුමට අමතර මුදල් බැර කළ හැක.<br>වඩාත් ඉහළ ලාභ බෙදාදීමේ අනුපාතයක්<br>මාස්පතා උපයාගනු ලබන ලාභය නැවත ආයෝජනය කිරීමේ හෝ Teen ඉතුරුම් ගිණුම වෙත මාරු කිරීමේ හැකියාව<br>කාලීන ආයෝජනය කල්පිරෙනුයේ දරුවාට අවුරුදු 18 පිරුණු පසුව පමණි. |
| අවශ්‍ය ලිපිලේඛන | මව, පියා හෝ භාරකරුගේ ජාතික හැඳුනුම්පත, විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය<br>දරුවාගේ උප්පැන්න සහතිකය |

| | |
|---|---|
| | ළමා ගිණුමට ස්ථාවර නියෝගයක් ලබා දී ඇති බවට සාක්ෂි<br>අයදුම්පත ළඟම පිහිටි අමානා බැංකු ශාඛාව වෙතින් ලබාගන්න. නැතිනම් මෙම වෙබ් ලිපිනය තුළින් බාගත කරගන්න: https://www.amanabank.lk/application-downloads.html |
| ගාස්තු | දැනට ක්‍රියාත්මක වන ගාස්තු අපගේ නිල වෙබ් අඩවියෙහි දක්වා තිබේ:<br>https://www.amanabank.lk/tariff-<br>services.html |
| නියමයන් හා කොන්දේසි | සේවාවන් සම්බන්ධ තොරතුරු සහ නියමයන් හා කොන්දේසි කලින් කලට වෙනස් වීමට ඉඩ ඇත. එම නිසා නවතම තොරතුරු සහ නියමයන් හා කොන්දේසි දැනගැනීම සඳහා ළඟම පිහිටි අමානා බැංකු ශාඛාව වෙත යන්න. නැතිනම් අපගේ නිල වෙබ් අඩවියට පිවිසෙන්න. https://www.amanabank.lk/pdf/application-downloads/general-business-conditions.pdf |
| රක්ෂණ ආවරණය | අමානා බැංකුව ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ සාමාජික බැංකුවකි. එමඟින් එක් තැන්පත්කරුවෙකුගේ නිසි සුදුසුකම් සපුරන තැන්පතු සඳහා රු. මිලියන 1.1 ක් දක්වා ආවරණයක් හිමි වේ. |
| ප්‍රතිචාර සහ පැමිණිලි | ඔබගේ ප්‍රතිචාර සහ පැමිණිලි පැය 24 පුරා ක්‍රියාත්මක අපගේ පාරිභෝගික විසඳුම් මධ්‍යස්ථානය වෙත යොමුකරන්න. අපගේ නියෝජිතයන් ඔබට අවශ්‍ය සහයෝගය නොපමාව ලබාදෙනු ඇත.<br><br>පාරිභෝගික විසඳුම් මධ්‍යස්ථානයේ දුරකථන අංකය: +94 11 7 756 756<br>ඊමේල් :<br>info@amana.lk \|<br>feedback@amana.lk<br>ඔබවේ විමසීම් අපගේ වෙබ් අඩවියහරහා යොමුකරන්න: www.amanabank.lk<br><br>කෙසේ නමුත් ඔබගේ අවශ්‍යතාව ඉටු නොවූයේ නම් ඒ බව ලිපියක් හෝ විද්‍යුත් ලිපියක් (ඊමේල්) මඟින් අප වෙත දැනුම් දෙන්න: |

| | |
|---|---|
| | කළමනාකරු - සේවා තත්ත්ව සහතිකකරණ<br>අමානා බැංකුව<br>අංක 485, ගාලු පාර, කොළඹ 03<br>ඊමේල්: servicequality@amana.lk |